# INTERNATIONAL TRADE (Part-II)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# ආරක්ෂණවාදය

දේශීය වෙළෙඳපොළට විදේශීය භාණ්ඩ ඇතුලු වීම සීමා කරන හෝ වළක්වන ඕනෑම ක්‍රියා පිළිවෙතක් ආරක්ෂණවාදය නමින් හැඳින්වේ.

# නිදහස් වෙළෙඳාමට බාධා කරන ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග

නිදහස් වෙළෙඳාමට බාධා කරන ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග ප්‍රධාන කොටස් දෙකකට වර්ග කළ හැකි ය. එනම්,

- තීරු බදු ආරක්ෂණය
- තීරු බදු නොවන ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග

ClassWork.LK

# තීරු බදු ආරක්ෂණය

තීරු බදු ආරක්ෂණය යනු අපනයන හා ආනයන මත බදු පැනවීම යි.

ආනයන මත තීරු බදු පැනවීමෙන් එම භාණ්ඩ මිල දී ගන්නා දේශීය පාරිභෝගිකයන්ට වැඩි මිලක් ගෙවීමට සිදු වීම නිසා ආනයන අධෛර්යවත් වේ.

ආනයන තීරු බද්දක් පැනවීමේ ප්‍රධාන අරමුණක් වනුයේ දේශීය නිෂ්පාදකයන් විදේශීය තරගයෙන් ආරක්ෂා කිරීම යි.

ආනයනික භාණ්ඩයක් සඳහා තීරු බදු පැනවූ විට දේශීය භාණ්ඩය සඳහා පාරිභෝගිකයන් යොමු වන බැවින් භාණ්ඩයේ දේශීය නිෂ්පාදනය ප්‍රසාරණය වේ.

මේ නිසා දේශීය භාණ්ඩයේ මිල ඉහළ නැංවීමට අවස්ථාවක් සැලසේ.

ClassWork.LK

**නාමික ආරක්ෂණ අනුපාතිකය**

මෙලෙස ආනයන භාණ්ඩ සඳහා ආනයන තීරු බදු වැඩි කිරීමක ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩයට ආනයනය කරනු ලබන භාණ්ඩයේ මිල ඉහළ යාමේ ප්‍රතිශතය තුළින් දේශීය නිෂ්පාදනයට ලැබෙන ආරක්ෂණය නාමික ආරක්ෂණ අනුපාතිකය (Nominal Rate of Protection) වශයෙන් හැඳින්වේ.

නාමික ආරක්ෂණ අනුපාතිකය මගින් දේශීය නිෂ්පාදකයාගේ මිල ආනයනය කරනු ලබන භාණ්ඩයේ දේශීය වෙළෙඳපොළ මිලෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කෙරේ.

නාමික ආරක්ෂණ අනුපාතිකය මගින් දේශීය භාණ්ඩය වෙත ලැබෙන සැබෑ ආරක්ෂණයේ ප්‍රමාණය නිවැරදිව පිළිඹිබු නොවේ.

ClassWork LK

## සඵල ආරක්ෂණ අනුපාතිකය

නාමික තීරු බදු අනුපාතිකය පනවනු ලබන්නේ ආනයනය කරනු ලබන අවසාන භාණ්ඩයේ වටිනාකම අනුව යි.

නමුත් දේශීය නිෂ්පාදකයන් ආනයනය කරන ලද අතරමැදි යෙදවුම් හා භාණ්ඩ රැසක් තම නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගනී.

මෙම යෙදවුම් හා අතරමැදි භාණ්ඩ මත ද තීරු බදු අය කර ඇති විටෙක නාමික තීරු බදු අනුපාතයට අනුව ගණනය කරනු ලබන නාමික ආරක්ෂණයේ ප්‍රමාණය මඟින් දේශීය භාණ්ඩය වෙත ලැබෙන සැබෑ ආරක්ෂණයේ ප්‍රමාණය නිවැරදිව පිළිඹිබු නොවේ.

මේ නිසා ආනයන තීරු බද්දක් පැනවීම මගින් දේශීය නිෂ්පාදකයාට ලැබෙන සැබෑ ආරක්ෂණයේ ප්‍රමාණය මැනීම සඳහා සඵල ආරක්ෂණ අනුපාතිකය යොදා ගනී.

සඵල තීරු බදු අනුපාතිකයට අනුව සඵල ආරක්ෂණ අනුපාතිකය ගණනය කරනු ලබයි.

ClassWork.LK

සඵල ආරක්ෂණ අනුපාතිකය ගණනය කිරීම සඳහා පහත සඳහන් සූත්‍රය යොදා ගනී.

$$ERP = \frac{(V_1 - V_0)}{V_0} \times 100$$

ERP = සඵල ආරක්ෂණ අනුපාතිකය

$V_1$= තීරු බද්ද පැනවූ විට දේශීය නිෂ්පාදකයාගේ එකතු කළ අගය

$V_0$ = නිර්බාධ වෙළෙඳපොළ තත්ත්වයක් යටතේ දේශීය නිෂ්පාදනයේ එකතු කළ අගය

ClassWork.LK

**නිදසුන 1 :**

කිසියම් රටක පාවහන් නිෂ්පාදන ආයතනයක් පාවහන් යුගලයක් රු. 5000/- ක මිලකට අලෙවි කරන්නේ යැයි ද එම පාවහන් යුගලය නිපදවීමට අවශ්‍ය යෙදවුම් (සම්, නූල්, ආදි) ආනයනය කිරීම සඳහා රු. 3 000/- ක් වැය කර ඇතැයි ද සිතමු. එවිට දේශීය නිෂ්පාදන ආයතනයේ එකතු කළ වටිනාකම රු. 2000/- (5 000 - 3 000) කි. එම දේශීය ආයතනය නිපදවන පාවහන් යුගලයට සමාන ආනයනික පාවහන් යුගලයක් වෙළෙඳපොළේ රු. 5 000/- කට අලෙවි කරන්නේ යැයි සිතමු.

ඒ අනුව දේශීය පාවහන් නිෂ්පාදන ආයතනයේ එකතු කළ අගය යම් හෙයකින් රු. 2 000/- කට වඩා වැඩි වුවහොත් දේශීය ව නිපදවන සපත්තු යුගලයේ වටිනාකම (මිල) රු. 5 000/- කට වඩා වැඩි වන නිසා ආනයනික පැවහන් යුගලය සමග තරග කිරීමට නොහැකි වේ.

මේ නිසා දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කිරීමට ආනයනික පාවහන් මත 10% ක ආනයන තීරු බද්දක් පැනවූයේ යැයි සිතමු. එවිට ආනයනික පාවහන් යුගලයක මිල පහත පරිදි වෙනස් වේ.

ClassWork.LK

තීරු බද්දට පෙර පාවහන් යුගලයේ මිල = රු. 5000

තීරු බද්ද සඳහා වැය වන මුදල = රු. $5000 \times \frac{10}{100}$

බද්දෙන් පසු ආනයනික පාවහන් යුගලයේ මිල = රු. 5000 + 500

= රු. 5500

මෙලෙස ආනයනකි පාවහන් සඳහා තිරු බද්දක් පැනවීම නිසා දේශීය නිෂ්පාදන ආයතනයේ එකතු කළ අගය රු. 2500 දක්වා ඉහළ නැංවීමේ හැකියාවක් තිබේ.

තීරු බද්දෙන් පසු ආනයනික පාවහන් යුගලයේ මිල = රු. 5500

තීරු බද්දෙන් පසු දේශීය නිෂ්පාදන ආයතනයේ = රු. 5500 - 3000

එකතු කළ අගය = රු. 2500

ඒ අනුව සඵල ආරක්ෂක අනුපාතිකය පහත සඳහන් පරිදි ගණනය කළ හැකි ය.

$$ERP = \frac{(V_1 - V_0)}{V_0} \times 100$$

$$= \frac{(2500 - 2000)}{2000} \times 100$$

$$= \underline{\underline{25\%}}$$

ClassWork.LK

ඉහත නිදසුනට අනුව නාමික තීරු බද්ද නිසා දේශීය නිෂ්පාදනයට 25% ක සඵල ආරක්ෂණයක් සැලසෙන බව පැහැදිලි වේ.

නමුත් ඉහත තීරු බද්ද පනවා ඇත්තේ අවසාන භාණ්ඩයේ වටිනාකම මත ය.

දේශීය ආයතනය පාවහන් නිෂ්පාදනයට අවශ්‍ය යෙදවුම් ආනයනය කිරීමේ දී යම් තීරු බද්දක් අය කර ඇත්නම් එය මේ තුළ අන්තර්ගත වී නැත.

එවිට ඉහත ගණනය කරන ලද සඵල ආරක්ෂණ අනුපාතිකය මගින් දේශීය නිෂ්පාදනයට ලැබෙන සැබෑ ආරක්ෂණයේ ප්‍රමාණය පිළිබිඹු නොවේ.

ආනයනික යෙදවුම් මත තීරු බද්දක් පනවා ඇති විටෙක සඵල තීරු බදු අනුපාතකය වෙනස් වන නිසා සඵල ආරක්ෂණ අනුපාතිකය වෙනස් වන ආකාරය පහත සඳහන් නිදසුන ඇසුරෙන් පැහැදිලි කර ගත හැකි ය.

ClassWork.LK

**නිදසුන 2 :**

ඉහත දක්වන ලද නිදසුන 1ට අනුව ආනයනය කරනු ලබන පාවහන් යුගලයක් සඳහා රු. 10% ක තීරු බද්දක් අය කරයි. මෙහි දී දේශීය නිෂ්පාදන ආයතනය ආනයනය කරන ලද යෙදවුම් සඳහා 5% ක තීරු බද්දක් අය කරතැයි සිතමු.

එවිට ආනයනික යෙදවුම්වල වටිනාකම, දේශීය එකතු කළ අගය වෙනස් වේ.

ඒ අනුව සඵල ආරක්ෂක අනුපාතිකය ද වෙනස් වේ.

තීරු බද්දට පෙර ආනයනික යෙදවුම්වල වටිනාකම = රු. 3000

යෙදවුම් සඳහා ගෙවන තීරු බදු ප්‍රමාණය = රු. $3000 \times \frac{5}{100}$

තීරු බද්දෙන් පසු යෙදවුම්වල වටිනාකම = රු. 150

තීරු බද්දෙන් පසු දේශීය එකතු කළ අගය = රු. 2500 - 150

= රු. 2350

සඵල ආරක්ෂණ අනුපාතිකය $\frac{2350 - 2000}{2000}$

= <u>17.5%</u>

ClassWork.LK

අවසාන භාණ්ඩයට බදු අය කිරීමට අමතර ව ආනයනික ආරක්ෂණ යෙදවුම් මත ද තීරු බදු පැනවීම නිසා සඵල ආරක්ෂණ අනුපාතය 7.5% කින් (25% - 17.5%) පහළ යන බව ඉහත නිදසුනට අනුව පැහැදිලි ය.

අනෙකුත් කරුණු නෙවෙනස්ව පවතින අවස්ථාවලදී පහත සඳහන් කොන්දේසි මත සඵල ආරක්ෂණ අනුපාතිකය ඉහළ අගයක් ගනී.

- ආනයනික නිෂ්පාදිතය මත පනවනු ලබන නාමික තීරු බදු අනුපාතිකය ඉහළ අගයක් ගැනීම

- ආනයනික යෙදවුම් මත පනවනු ලබන තීරු බදු අනුපාතික පහළ අගයක් ගැනීම

- භාණ්ඩයේ වටිනාකම තුළ ආනයනික යෙදවුම් ප්‍රතිශතය පහළ අගයක් ගැනීම

ClassWork.LK

# තීරු බදු නොවන ක්‍රියාමාර්ග

ආනයන සහ අපනයන බදුවලට අමතරව ආරක්ෂණය සඳහා යොදා ගන්නා ක්‍රියාමාර්ග තීරු බදු නොවන ක්‍රියාමාර්ග වේ. එවැනි ක්‍රියාමාර්ග කීපයක් පහත දැක්වේ.

- සලාක කිරීම හෙවත් කෝටා නියම කිරීම
- දේශීය නිෂ්පාදකයින්ට සහනාධාර හෝ දිරිගැන්වීම් හෝ ලබා දීම
- ප්‍රපාතනය
- ස්වෙච්ඡාවෙන් අපනයන සීමා පනවා ගැනීම
- විදේශ විනිමය පාලනය
- අපනයන හා ආනයන සීමා පැනවීම
- වෙළෙඳ සම්බාධක පැනවීම
- පරිපාලන හා තාක්ෂණික ප්‍රමිතීන් නියම කිරීම

ClassWork.LK

# ආරක්ෂණවාදයට පක්ෂ තර්ක

ආරක්ෂණවාදයට පක්ෂ ව පහත සඳහන් තර්ක ඉදිරිපත් කළ හැකි ය.

- දේශපාලන හා ආර්ථික තීරණ ගැනීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී ආරක්ෂණවාදී ප්‍රතිපත්ති අනුගමනය කිරීම වැදගත් වේ.

- දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමටත් ඒවායේ සේවා නියුක්ත සේවකයන්ගේ රැකියා ආරක්ෂා කිරීම සඳහාත් ආරක්ෂණවාදී ප්‍රතිපත්ති වැදගත් වේ.

- සීමිත භාණ්ඩ කීපයක් මත විශේෂ ප්‍රාගුණ්‍ය කරමින් අන්තර්ජාතික වෙළෙඳාමේ නිරත වන රටවල් මුහුණ පාන උච්චාවචනය වළක්වා ගැනීම (ආර්ථික ස්ථායිතාව ඇති කිරීම) සඳහාත්, රටවල ආර්ථිකය විවිධාංගීකරණය කර ගැනීම සඳහාත් ආරක්ෂණවාදී ප්‍රතිපත්ති අනුගමනය කිරීම වැදගත් වේ.

- ප්‍රපාතනය වළක්වා ගැනීම සඳහා ආරක්ෂණවාදය වැදගත් වේ.

ClassWork.LK

- ගෙවුම් ශේෂ දුෂ්කරතාවලට විසඳුම් සෙවීමේ දී උපකාරී වේ.

- දේශීය සම්පත් උපයෝජනය ඉහළ නැංවීම සඳහා වැදගත් වේ.

- අවගුණ භාණ්ඩ ආනයන වැළැක්වීමේ දී ආරක්ෂණවාදය වැදගත් වේ.

ClassWork.LK

# ආරක්ෂණවාදයට විපක්ෂ තර්ක

ආරක්ෂණවාදයට විපක්ෂ ව පහත සඳහන් තර්ක ඉදිරිපත් කළ හැකි ය.

- ආරක්ෂණවාදී ප්‍රතිපත්ති අනුගමනය කිරීම නිසා දේශීය හා විදේශීය වෙළෙඳපොළ සංකෝචනය විය හැකි ය.

- විදේශ වෙළෙඳාම සංකෝචනය වීම නිසා ජාතික ආදායම අඩු විය හැකි ය.

- දේශීය නිෂ්පාදනවල පිරිවැය අඩු කිරීමට සානුබල නොමැති නිසා අකාර්යක්ෂම කර්මාන්ත බිහි විය හැකි ය.

- ගුණාත්මක බවින් ඉහළ භාණ්ඩ නිෂ්පාදනය අඩු විය හැකි ය.

- දියුණු තාක්ෂණය සංක්‍රමණයට බාධා ඇති විය හැකි ය.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura